සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

57 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

Second Term Test - Grade 12 - 2020

විභාග අංකය .............................

## නාට්‍ය හා රංගකලාව I

කාලය පැය තුනයි

උපදෙස්

- I කොටස සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටසේ A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

- **නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

01. ''සුඛ, දුක්ඛ ආදී වු ස්වභාවික සතර අභිනය මගින් අනුකරණය කිරීම නාට්‍යයයි.'' යනුවෙන් ප්‍රකාශ කළේ,
1. බුදුන් වහන්සේ ය. 2. විලියම් ශේක්ෂ්පියර් ය. 3. බර්නාඩ් ෂෝ ය.
4. භරතමුනිවරයාය. 5. ඇරිස්ටෝටල් ය. (..........)

02. නූතන සිංහල නාට්‍ය කලාවේ සන්ධිස්ථානයක් වූ නාට්‍ය නිර්මාණය සේ සැලකෙන්නේ,
1. මෝදර මෝල ය. 2. හුණුවටයේ කතාව ය. 3. සිංහබාහු ය.
4. නරිබෑනා ය. 5. මනමේ ය. (..........)

03. නාට්‍යක ප්‍රේක්ෂක රසයට ආසන්නතම හේතුව වන්නේ,
1. වේදිකා පරිපාලකය 2. අධ්‍යක්ෂකවරයාය 3. නළු නිලියන් ය.
4. පෙළ මතක් කරන්නන් ය. 5. අංග රචනා ශිල්පීන්ය. (.........)

04. සොඳුරු අඥාදායකයා ලෙස හැඳින්වෙන්නේ,
1. පෙළ රචකයාය. 2. නළු නිළියන් ය. 3. වේදිකා පරිපාලකය
4. අධ්‍යක්ෂකවරයාය. 5. ආලෝක ශිල්පීන් ය. (..........)

05. නාට්‍ය කලාව අලලා ලියවුණු ලොව ප්‍රථම විචාර ග්‍රන්ථය වන්නේ,
1. කාව්‍ය ශාස්ත්‍රය 2. දශ රූපකය 3. නාට්‍ය ශාස්ත්‍රය
4. අභිනය දර්පනය 5. රස විවරණයයි. (..........)

06. නෘත්ත, නෘත්‍ය, නාට්‍ය සංකල්පය පිළිබඳ නිවැරදි අර්ථ නිරූපණය ඇතුළත් ප්‍රකාශය වන්නේ,
1. නෘත්‍යයෙන් කිසිදු භාව ප්‍රකාශනයක් සිදු නොවේ.
2. නෘත්‍ය යනු රිද්මයානුකූල ගාත්‍රා වික්ෂේපයක් පමණි.
3. නාට්‍ය නෘත්ත තරම් ප්‍රබල නැත.
4. භරතමුනි මූලිකත්වය දුන්නේ නෘත්ත සම්බන්ධයෙන් පමණි.
5. නාට්‍යට නෘත්ත හා නෘත්‍යයේ සහය අවශ්‍ය නැත. (..........)

07. ශ්‍රී ලංකාවේ බෞද්ධ පූජා කර්ම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. අනුකරණය, සමාරෝපය, අනුරූපණය අන්තර්ගත නොවේ.
2. ආලවක දමනය රූකඩ උපයෝගිකරගෙන ඉදිරිපත් කරයි.
3. දොරකඩ අස්නෙන් මිලින්ද ප්‍රශ්නය ඉදිරිපත් කෙරේ.
4. යුගාසන බණ භික්ෂූන් දෙදෙනෙකු අතර සිදුවන සංවාදයකි.
5. මිලින්ද ප්‍රශ්නය ගිහියන් විසින් ඉදිරිපත් කරයි. (..........)

08. නාට්‍ය සංගීතය පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,
1. සංගිතය සාත්වික අභිනයට අයත් වේ.
2. මිනිස් හඬ පමණක් නාට්‍යක සංගීතයට යොදා ගැනීම අනුචිතය.
3. සංගීතය යොදා නොගෙන වුවද නාට්‍ය නිෂ්පාදනය කළ හැක.
4. එදිනෙදා භාවිත සංගීතය හා නාට්‍ය සංගීතය අතර වෙනසක් නැත.
5. ගායන වාදන හඬ පමණක් සංගීතය සේ සැලකේ (..........)

09. ප්‍රාසාංගික කලා පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
1. සිනමාව, ටෙලි නාට්‍ය, වීදි නාට්‍ය, ඔපෙරා, බැලේ
2. නර්තනය, සංගිතය, නාට්‍ය, ඔපෙරා, බැලේ
3. සංගීතය, නර්තනය, ගුවන්විදුලි නාට්‍ය, ගැමි නාටක, බැලේ
4. ගීත නාට්‍ය, මුද්‍රා නාට්‍ය, බැලේ, ඔපෙරා, වේදිකා නාට්‍ය
5. වීදි නාට්‍ය, ටෙලි නාට්‍ය, බැලේ, ඔපෙරා, ගීත නාට්‍ය (..........)

10. ශෛලිගත සම්ප්‍රදායට අනුව නිර්මාණය වූ නාට්‍ය ඇතුලත් වරණය තෝරන්න.
1. ලෝම හංස, හරිම බඩු හයක්, මුදු පුත්තු
2. මුදු පුත්තු, මනමේ, මගුල් පරස්තාව
3. ලෝම හංස, මුදු පුත්තු, තලමල පිපිලා
4. මනමේ, සිංහබාහු, ගුරු තරුව
5. ලෝම හංස, රත්තරං, වෙල්ලවැහුං (..........)

- **පහත දැක්වෙන්නේ ගැමි කලාව සම්බන්ධයෙන් වූ ප්‍රකාශ කිහිපයකි.**

A – ගැමි සමාජයේ ඇදහිලි හා විශ්වාස පදනම් කරගෙන බිහිවූ කලා විශේෂයකි.
B – ලාලිත්‍යක් ප්‍රකට කරන කලා විශේෂයකි.
C – රටක දේශිය සංස්කෘතික ලක්ෂණ පිළිබිඹු කරන නිර්මාණ විශේෂයකි.
D – සංගීත, චිත්‍ර, නර්තන නාට්‍ය ආදී සියුම් කලා මේ ගණයට අයත් වේ.
E – විවිධ සරල රටා හා මෝස්තර වලින් යුක්තය.

11. ඉහත ප්‍රකාශ අතරින් ගැමි කලාවට අදාල නිවැරදි ප්‍රකාශ ඇතුලත් පිළිතුර වන්නේ,
1. A B C ය. 2. A C E ය. 3. A B E ය. 4. C D E ය. 5. B D E ය. (..........)

12. ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් නිර්මාණය කළ නාට්‍ය කරුවෙකි.
1. ගුණසේන ගලප්පත්ති 2. හෙන්රි ජයසේන 3. ධර්මසිරි බණ්ඩාරනායක
4. කේ.බී. හේරත් 5. එදිරිවීර සරච්චන්ද්‍ර (..........)

13. නූතන ශ්‍රී ලංකාවේ ලෝක ධර්මී නාට්‍ය පුරෝගාමී නාට්‍යකරුවා වන්නේ,
1. සුගතපාල සිල්වා 2. එදිරිවීර සරච්චන්ද්‍ර 3. හෙන්රි ජයසේන
4. දයානන්ද ගුණවර්ධන 5. ගුණසේන ගලප්පත්ති (..........)

- **පහත දැක්වෙන තොරතුරු ඇසුරින් 14 සිට 18 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A – සේරමන් රජ B – පත්තිනි දේවිය C - මැණික්පාල බිසව D – වඩිග පටුන
E – මංගර සමය F – අඹ විදමන G - ගුරුගේ මාලාව H – කපුයක්කාරිය
I – පිච්චමල් කුමාරි J – දර්පණ යක්කම

14. රිද්දි යාගය හා සම්බන්ධ ප්‍රකාශ වන්නේ,
1. GD 2. HI 3. EH 4. AJ 5. AB (..........)

15. කොහොඹාකංකාරිය අයත් පෙළපාලි වන්නේ,
1. GJ 2. GC 3. JE 4. CF 5. BH (..........)

16. පහන් මඩුව හා සම්බන්ධ වන්නේ,
1. AI 2. IH 3. AB 4. EF 5. BH (..........)

17. සූනියම් යාගය හා සම්බන්ධ වන්නේ,
1. AI 2. CD 3. BI 4. AB 5. HI (..........)

18. උපත් කතා හා සම්බන්ධ චරිත වන්නේ,
1. ACIB 2. ACEG 3. BDFH 4. DFHJ 5. GIBD (..........)

19. ඇත් බන්ධනය හා මී බන්ධනය ඇතුළත් වනනේ පහත දැක්වෙන කවර ශාන්ති කර්මයකට ද?,
1. සන්නියකුම 2. දෙවොල් මඩුව 3. සූනියම් යාගය
4. රට යකුම 5. කොහොඹා කංකාරිය (..........)

20. අඹ විදමන හා මරා ඉපැද්දවීම අයත් වන්නේ කවර ශාන්ති කර්මය ද?
1. සූනියම් යාගය 2. ගරායකුම 3. පූනා මඩුව
4. රිද්දි යාගය 5. ගම්මඩුව (..........)

21. සිනමාවට අදාල නොවන වරණය තෝරන්න.
1. ශ්‍රව්‍ය දෘෂ්‍ය කලා මාධ්‍යකි.
2. රූපරාමු දූරස්ථ මධ්‍යස්ථ හා සමීපස්ථ වශයෙන් ඉදිරිපත් කළ හැක.
3. නළු නිළියන් කතාවේ එන සියළු දෙබස් වනපොත් කර ගැනීම අවශ්‍ය නොවේ.
4. ප්‍රේක්ෂක ප්‍රතිචාර චිත්‍රපට දර්ශනය කෙරෙහි බෙහෙවින් බලපායි.
5. කලින් නිර්මාණය කොට ගබඩා කර තැබිය හැකි කලා මාධ්‍යයකි. (..........)

22. නාට්‍ය හා සම්බන්ධ නොගැලපෙන වරණය තෝරන්න.
1. හිස් පුටු ගොඩක් ඉදිරියේ වුවද රග දැක්විය හැකිය.
2. නළු ප්‍රේක්ෂක සහ සම්බන්ධය පවත්වා ගැනීමට පහසුය.
3. නළු නිළියන් තමන්ගේ සංවාද ඛණ්ඩ වනපොත් කරගැනීම අවශ්‍යය.
4. නාට්‍යක් ඉදිරිපත් කිරිමට විශාල ශිල්පීන් පිරිසකගේ සහය අවශ්‍යය.
5. සෑම නාට්‍ය දර්ශනයකට නාට්‍ය අධ්‍යක්ෂවරයා ක්‍රියාකාරිව සිටීම වැදගත් ය. (..........)

23. ටෙලි නාට්‍යට අදාල නොවන වරණය තෝරන්න.
1. සජීවි කලා මාධ්‍යක් නොවේ.
2. සංස්කරණය ඉතා වැදගත් තැනක් දරයි.
3. එකම කතාව කොටස් වශයෙන් ප්‍රදර්ශන කළ හැකිය.
4. ප්‍රේක්ෂකයන් හා සජීවීව සම්බන්ධ නොවේ.
5. සියළුම දර්ශන කලානුරූපීව රූගත කිරීම අත්‍යාවශ්‍ය වේ. (..........)

24. රසිකයෙක් යනු,
1. ඕනෑම ප්‍රේක්ෂකයෙකු හදුන්වන නාමයකි. 2. නාට්‍යක් රසවත්ම ඉදිරිපත් කරන්නාය.
3. උසස් නිර්මාණයක් කිරීමට සමත් කලාකරුවාය. 4. සහෘදයා යන්නට සමාන අර්ථයක් ගෙන දේ
5. ප්‍රතිභා හා ව්‍යුත්පත්ති ශක්තීන්ගෙන් යුක්ත වුයෙකි. (..........)

25. දකුණු පස රූපයෙන් දැක්වෙන නාට්‍යකරු,

1. විලියම් ශේක්ෂ්පියර් 2. ඇන්ටන් චෙකොෆ්
3. හෙන්රික් ඉබ්සන් 4. ලුයිජි ජිරුන්ඩෙලෝ
5. මොලියර් (..........)

26. දකුණු පස රූපයෙන් දැක්වෙන්නේ,


1. ගුල්ම සන්නිය හා ගිනි ජල සන්නිය
2. කණ සන්නිය හා අමුක්කු සන්නිය
3. වාත සන්නිය හා ගොළු සන්නිය
4. කණ සන්නිය හා කොර සන්නිය
5. ගුල්ම සන්නිය හා වාත සන්නිය (..........)

27. නවමල් පාය යනු,
1. මල් මඩුව හෙවත් රට යකුන් වීදියට කියන තවත් නමකි.
2. නූතන රංග ශාලාවකි.
3. සූනියම් වීදියට සමාන තවත් නමකි.
4. දොරකඩ අස්න ඉදිරිපත් කරන වේදිකාවයි.
5. කොහොඹා කංකාරිය සඳහා යොදා ගන්නා මඩුවයි. (..........)

28. ප්‍රොසීනියම් වේදිකාව නමින් හදුන්වන්නේ,
1. ශේක්පියර් රග හලයි. 2. ග්‍රීක රගහලයි. 3. පින්තූර රාමු වේදිකාවයි.
4. චක්‍ර වේදිකාවයි 5. මධ්‍යකාලීන යුරෝපීය රගහලයි.

29. 'ගල් මුගුරු ගහලා මරා දාන එක වැදගත් සිද්ධියක් ද' මෙම සංවාදය ඇතුළත් නාට්‍ය නිර්මාණය වන්නේ,
1. ඊඩිපස් 2. බෝනික්කි ගෙදර 3. ඇන්ටිගනී
4. කුවේණි 5. මනමේ (..........)

30. සංවාදාත්මක ගීතයක් නොවන්නේ,
1. මොනවද මුත්තේ මොකද කරන්නේ 2. සිනා මල් ගොඩක් නෑ කඳුළු මල් ගොඩක්
3. අක්කෙ ටිකක් ඉන්න කෝ 4. රෑ පැල් රකින කුරහන් පැහෙනා හේනේ
5. මේ තරම් සියුමැලිද කළුගල් (..........)

31. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ නාට්‍යමය පෙළ පාලිවල ඇතුලත් රංග භාණ්ඩ වන්නේ,
1. කඩු හා පළිහ 2. අඹ ගෙඩිය හා දුන්න
3. කැඩපත හා පනාව 4. දන් කඳ හා නයි රුව
5. වංගෙඩිය හා ලන්තෑරුම (..........)

32. නළුවාගේ කායික හා මානසික සැහැල්ලුව ඇති කිරීම සම්බන්ධයෙන් වඩාත් ගැලපෙන ප්‍රකාශය සහිත පිළිතුර වන්නේ,
1. ශිථිලකරණ අභ්‍යාස හා ශ්වසන අභ්‍යාස 2. ශිථිලකරණ අභ්‍යාස හා චලන අභ්‍යාස
3. ශ්වසන අභ්‍යාස හා රංග ක්‍රීඩා 4. ශිථිලකරණ අභ්‍යාස හා රංග ක්‍රීඩා
5. රංග ක්‍රීඩා හා සංවේදන අභ්‍යාස (..........)

33. ''බඩහැල මලේ අරගෙන පලයං බොක්ක,'' ''නොදෝ කිං හූච්චි අම්මා'' ප්‍රකාශයන්ට ගැලපෙන පිළිතුරු,
1. කොහොඹා කංකාරිය හා දහ අට සන්නිය 2. වඩිග පටුන හා රිද්දි යාගය
3. සූනියම් යාගය හා ගම්මඩු 4. කොහොඹා කංකාරිය හා රිද්දි යාගය
5. කොහොඹා කංකාරිය හා දොවොල් මඩුව (..........)

34. ශෛලීගත නාට්‍යකදී වේදිකා පසුතල මැවීම සඳහා යොදා ගන්නා උපක්‍රමයක් විය හැක්කේ,
1. සංකේතාත්මකව නිර්මාණය කොට වේදිකාවේ සවි කිරීමයි.
2. සැබෑ පරිසරයට ගමන් කොට පසුතල නිර්මාණය කිරීමයි.
3. ගීත හා සංවාද මගින් පසු තලය පිළිබඳ ඉඟි සැපයීමයි.
4. වේදිකාව මත රජමාලිගාවක් ලෙස සකස් කිරීමයි.
5. සෘජුරෝම් ආකෘති සකස් කිරීමයි. (..........)

- **ප්‍රශ්න අංක 35 සිට 40 දක්වා පිළිතුරු සැපයීමට පහත නාට්‍ය ගීත උපයෝගී කරගන්න.**

A – සීතා මා සිරියා ඉන්නේ
B – සෝබාව දේ මෙපුර
C - පුංචි කතාවක් කියන්න
D – මගෙ මන්ද්‍රි නම් බිසෝ
E – අප රට අරබල ආන්තරාවක
F – යුධ හටය යන යුදයට
G - යස ඉසුරු පිරුණු තැනා
H - සත් සියත් කපු මල්
I – තැන් තැන් වලම රැදී
J – සිනා පිපෙනා මේ වසන්තේ
K – රතඳර සිරයා පරදින
L – ආලෙ බැන්ද මාගේ
M – විභාගේ විභාගේ
N – හන්තානට පායන හද
O – ආරා තල් ගස ගොන් වැඩුන
P – මල් පිපෙයි දෙනෙත්
Q – දූලා නෙතු පූලා
R – මේ තරම් සියුමැලිද
S – බුදුනේ ........

35. හෙන්රි ජයසේනගේ නාට්‍ය වලට අයත් ගීත වන්නේ,
1. AC 2. FH 3. FM 4. DE 5. QR (..........)

36. නූර්ති නාට්‍යන්ට අයත් ගීත වන්නේ,
1. FH 2. SK 3. MN 4. JL 5. AD (..........)

37. සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යන්ට අයත් ගීත වන්නේ,
1. CB 2. PS 3. MO 4. IQ 5. FK (..........)

38. නව නාට්‍ය ගීත වන්නේ,
1. AC 2. BG 3. QR 4. EF 5. HI (..........)

39. සෝමලතා සුබසිංහගේ නාට්‍යන් හි ඇතුළත් ගීත වන්නේ,
1. CM 2. AM 3. MQ 4. OD 5. KM (..........)

40. ජයලත් මනෝරත්නයන්ගේ නාට්‍යයන්ට අයත් ගීත වන්නේ,
1. BE 2. EO 3. QS 4. HI 5. AM (..........)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - දෙවන වාර පරීක්ෂණය 2020**

**නාට්‍ය හා රංගකලාව**

12 ශ්‍රේණිය

**I පත්‍රය - II කොටස**

උපදෙස්:-

**A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## A - කොටස

01. i. භූමිකාවක් යනු කුමක්ද? (ලකුණු 04 යි)

ii. ඔබ නරඹා ඇති නාට්‍ය දෙකක චරිත දෙකක් දක්වා එම චරිතවල ඇති භූමිකා ලියන්න. (ලකුණු 05 යි)

iii. විවිධ භූමිකා අතර ගොඩනැගෙන පරස්පරතා හා එකඟවීම් නිසා නාට්‍යයේ ක්‍රියා විකාශනය සිදුවන ආකාරය ඔබ කැමති නාට්‍යක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

02. i. පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ශාන්ති කර්ම 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. ඔබ කැමති පහතරට ශාන්තිකර්මයක නාට්‍යමය අවස්ථා 02 ක් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iii. 'ශාන්තිකර්ම මනෝචිකිත්සක වෛද්‍ය ක්‍රමයකි.' ශාන්ති කර්මයක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

03. i. වේදිකා නාට්‍ය දෙකක් නම් කර එහි සංගීත නිර්මාණ ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 04 යි)

ii. සංගීතයේ භාව ප්‍රකාශනමය ගුණය ඇති කරන මූලිකාංග පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iii. 'වේදිකා නාට්‍යයක අවස්ථා උද්දීපනය කිරීමට සංගීතය යොදාගනී.' ඔබ නැරඹූ නාට්‍යයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## B - කොටස

04. i නාට්‍ය ලක්ෂණ අන්තර්ගත දේශීය පූජා කර්ම හා අභිචාර විධි 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. බෞද්ධ පූජා කර්මවලට පාදක වූ කතා වස්තු දෙකක් කෙටියෙන් ලියන්න. (ලකුණු 05 යි)

iii. බෞද්ධ පූජා කර්මවලට සතර අභිනය යොදාගත් ආකාරය පූජා කර්ම දෙකක් ආශ්‍රයෙන් විමසන්න. (ලකුණු 06 යි)

05. i. කුවේණි නාට්‍යයේ නාට්‍යෝචිත අවස්ථා 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. 'කුවේණි නාට්‍ය සැබෑ ගැහැණියට සාධාරණය ඉටු කරයි' මෙම මතය විමසන්න. (ලකුණු 05 යි)

iii. නව ආකෘතියක් සොයා ගිය නාට්‍යයක් වශයෙන් කුවේණි සාර්ථක වී තිබේද? ඔබේ පිළිතුර නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

06. i. කුවේණි නාට්‍යයේ තේමාව කුමක්ද? (ලකුණු 04 යි)

ii. කුවේණි නාට්‍යයේ චරිත නිර්මාණය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iii. කුවේණි නාට්‍යය මූලාශ්‍රයෙන් වෙනස් වන ආකාරය නාට්‍ය පෙළ ඇසුරෙන් සංසන්දනාත්මකව විමසන්න. (ලකුණු 06 යි)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

57 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020
Second Term Test - Grade 12 - 2020

විභාග අංකය .............................

# නාට්‍ය හා රංගකලාව II

කාලය පැය තුනයි

උපදෙස්

- I කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## I – කොටස

- **නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුරේ අංකය ඉදිරියෙහි ඇති වරහන් තුළ ලියන්න.**

01. ඇරිස්ටෝටල් විසින් නාට්‍යයේ වැදගත්ම අංගය ලෙස සැලකුවේ,
1. චින්තනය 2. ප්‍රේක්ෂාව 3. වාග් විලාසය
4. චරිතය 5. කතා වින්‍යාසය (.........)

02. 'කුක්ලෝප්ස්' යනු,
1. ග්‍රීක ට්‍රැජඩියකි 2. ග්‍රීක කොමඩියකි 3. රෝම ප්‍රහසනයකි.
4. ග්‍රීක සටුර නාටකයකි. 5. රෝම ට්‍රැජඩියකි (.........)

03. ග්‍රීක නාට්‍ය තාත්විකත්වය කරා යොමු කිරීමේ පුරෝගාමියා වන්නේ,
1. ඇරිස්ටොෆානිස් ය. 2. ඊස්කිලස් ය. 3. සොෆොක්ලීස්ය
4. යුරිපිඩීස් ය. 5. මිනැන්ඩර් ය.
(.........)

04. ග්‍රීක සටුර නාට්‍ය පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නොගැලපෙන ප්‍රකාශය වන්නේ,
1. ට්‍රැජඩි තුනක් අවසානයේ සටුර නාටකයක් රඟ දැක්වීය.
2. සටුර නාටකයක් නම් කෙරුනේ එහි ගායනවෘන්දය අනුවය.
3. සොෆොක්ලීස්ගේ ඉග්නෙව්ටායි යනු සැටර් නාට්‍යකි.
4. සටුර නාටක හාස්‍යෝත්පාදක නාට්‍ය විශේෂයකි.
5. යුරිපිඩිස්ගේ මීඩියා යනු සටුර නාටකයකි. (.........)

05. ග්‍රීක ට්‍රගෝඩියේ ලක්ෂණයක් නොවන්නේ,
1. නාට්‍ය පෙළ රචනයේදී පශ්චාත් දෘෂ්ටිකථන ක්‍රමය අනුගමනය කිරීමය.
2. සාත්වික අභිනය මැනවින් යොදාගෙන තිබීමය.
3. රංගාලෝකන ක්‍රමයක් යොදා නොගැනීමය.
4. නාට්‍ය දර්ශන තරඟාකාරයෙන් පවත්වනු ලැබීමය.
5. බිහිසුනු දර්ශන වේදිකාව මත ඉදිරිපත් නොකිරීමය (.........)

06. ලෝකයේ පැරණිම නාටක සාහිත්‍ය අයත් වන්නේ,
1. ඉන්දියාවටයි. 2. ග්‍රීසියටයි. 3. යුරෝපයටයි. 4. ජපානයටයි. 5. රෝමයටයි.
(.........)

07. ට්‍රැජඩියක කතා නායකයා,
1. සෑම විටම දෛවය හා සටන් වදියි. 2. නිරන්තරයෙන්ම හාස්‍යට ලක්වේ.
3. නිරන්තරයෙන්ම දැනුවත්ව වැරදි කරයි. 4. සෑම විටම ස්වකීය අභිමතාර්ථ ඉටු කර ගනියි.
5. නිරන්තරයෙන්ම විකට සංවාදයන්හි යෙදෙයි. (.........)

08. ප්‍රථම වරට ඩිතිරැම්බෝස් ගායක වෘන්දයට එක්වූ නළුවා වන්නේ,
1. පෙරියන්ඩර් ය. 2. අරියොන් ය. 3. තෙස්පීස් ය.
4. සොලොන් ය. 5. මෙනන්ඩ්‍රොස් ය. (.........)

09. මුල්ම මධ්‍යකාලීන ජනවන්දනා නාට්‍ය ලෙස සැලකෙන්නේ,
1. පළමු එඬේරාගේ කතාව ය. 2. මරියවරුන් තිදෙනාගේ කතාව ය.
3. දෙවන එඬේරාගේ කතාව ය. 4. ආදම්ගේ කතාව ය.
5. දූවේ රජතුන්කට්ටුව ය. (.........)

10. ඊඩිපස් නාට්‍යයේ වේදිකාව මත රඟ දක්වා පෙන්වන අවස්ථාවක් විය හැක්කේ,
1. ඊඩිපස් නෙත් අඳ කර ගැනීමය. 2. යොකස්ට්‍රා නෙත් අඳ කර ගැනීමය.
3. ඊඩිපස් අතින් ලායුස් ඝාතනය වීමය. 4. යොකස්ට්‍රා ඊඩිපස් වෙතින් ශෝකීව නික්ම යාම.
5. ස්ෆින්ක්ස් ප්‍රහේලිකා විමසීමයි. (.........)

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්න සඳහා පහත සඳහන් පින්තූරය ඇසුරින් පිළිතුරු සපයන්න.**




11. ඉහත රූපයේ දැක්වෙන වේදිකාවේ A අක්ෂරයෙන් දැක්වනුයේ,
1. පැරඩොස් ය. 2. තයිම්ලිය. 3. ලොජියම්ය.
4. ප්‍රේක්ෂකාංගනයයි. 5. රංග භූමියයි. (.........)

12. ඉහත රූපයේ B අක්ෂරයෙන් දැක්වෙනුයේ,
1. පැරසීනියම් ය. 2. පැරඩොස් ය. 3. ඔකෙස්ට්‍රා ය. 4. ප්‍රොසීනියම් ය. 5. ස්කිනි ය.
(.........)

13. ඉහත රූපයේ C අක්ෂරයෙන් දැක්වෙනුයේ,
1. ස්කිනි ය. 2. පැරසීනියම් ය. 3. එපිසීනියම් ය. 4. පැරඩොස් ය. 5. ඔකෙස්ට්‍රා ය.
(.........)

14. ඉහත රූපයේ D අක්ෂරයෙන් දැක්වෙනුයේ,
1. එපිසීනියම් ය. 2. පැරසීනියම් ය. 3. ලොජියම් ය. 4. ඔකෙස්ට්‍රා ය. 5. තයිම්ලිය.
(.........)

15. ඉහත රූපයේ E අක්ෂරයෙන් දැක්වෙනුයේ,
1. ප්‍රොසීනියම් ය. 2. ලොජියම් ය. 3. තයිම්ලිය. 4. පැරඩෝස් ය. 5. එපිසීනියම් ය.
(.........)

16. නාට්‍ය විචාරයකට අදාල නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. නාට්‍ය විචාරය පිළිබඳ පැරණිම ග්‍රන්ථ රචනා වූයේ ශෝකජනක නාට්‍යවලට අදාලවය.
2. නාට්‍ය විචාරය පිළිබඳව පිළිගත් සිද්ධාන්ත කිසිවක් නැත.
3. නාට්‍ය විචාරකයා හොඳ රසිකයෙක් නොවේ.
4. නාට්‍ය විචාරය සිදුවන්නේ අපරදිග නාට්‍ය කලාවේ පමණි.
5. නාට්‍ය කලාවේ අභිවෘද්ධිය සඳහා විචාර කලාවක් අත්‍යාවශ්‍ය ය. (.........)

17. 'රූකඩගෙදර' නාට්‍ය,
1. ප්‍රහසනයකි. 2. කොමඩි නාටකයකි. 3. රොමැන්ටික් නාටකයකි.
4. අති නාටකයකි. 5. යථාර්තවාදී නාටකයකි. (.........)

18. වේදිකා නාට්‍ය ආනුශාංගික අංග පිළිබඳව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. ආනුශාංගික අංග නාට්‍යක ප්‍රේක්ෂාවට බලපෑමක් කරන්නේ නැත.
2. රංගාලෝකය මීට අයත් නොවේ.
3. ආනුශාංගික අංග උපරිම වශයෙන් යෙදීමෙන් නාට්‍යක් සාර්ථක වේ.
4. පෙරදිග සංකල්ප අනුව ආහාර්ය අභිනයට අයත් වේ.
5. අධ්‍යක්ෂකවරයාගේ මැදිහත්වීම අවශ්‍ය නොවේ. (.........)

19. "Caravan" යනු,
1. ග්‍රීසියේ එළිමහන් රංග පීඨයයි. 2. මධ්‍යකාලීන නාට්‍ය කලාවේ සංදර්ශන කරත්තයයි.
3. ග්ලෝබ් රංග භූමියේ එළිමහන් අවකාශයයි. 4. රෝම රඟමඬලේ ප්‍රේක්ෂක ගෘහයයි.
5. ඔකෙස්ට්‍රාවයි. (.........)

20. කිතුනු ශාන්තුවරයන්ගේ ජීවිත අලලා නිර්මාණය වූ නාට්‍ය වන්නේ,
1. මිස්ටරි 2. මිරකල් 3. මොරැලිටි 4. ප්‍රහසන 5. පාස්කු (.........)

- **21 සිට 24 දක්වා ප්‍රශ්න වලට පහත සඳහන් වගුව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.**

| | | |
|---|---|---|
| A. අඩිපාරේ යන්නෝ | F. මෙරේපේ | K. දෙබරු |
| B. එක්සිඩෝස් | G. උමං දොරටු | L. ප්ලැටියා |
| C. හෝසන්තා | H. සුගති උයන | M. මග්දලේනා |
| D. ඩෙල්ෆි | I. තීබය | N. මැඩියෝ |
| E. බූත් | J. පැරඩෝස් | O. ස්කින් |

21. මධ්‍යකාලීන නාට්‍ය කලාව හා සම්බන්ධ වන්නේ,
1. B, F, O 2. C, E, N 3. D, M, J 4. C, H, M 5. I, L, O (.........)

22. මධ්‍යකාලීන රංගභූමිය හා සම්බන්ධ වන්නේ,
1. B, E, K 2. E, G, L 3. G, I, N 4. A, H, M 5. C, L, O (.........)

23. ග්‍රීක රංග භූමිය හා සම්බන්ධ වන්නේ,
1. B, F, I 2. C, G, L 3. B, J, O 4. B, E, O 5. G, D, J (.........)

24. ප්‍රසිද්ධ ග්‍රීක නාට්‍ය පිටපත් වන්නේ,
1. E, K, O 2. A, K, N 3. A, D, F 4. F, I, N 5. J, L, N (.........)

25. ඩෝල්ස් හවුස් නාට්‍යයේ මුල් පිටපත රචනා වී ඇත්තේ,
1. ඉංග්‍රීසි භාෂාවෙනි 2. රුසියන් භාෂාවෙනි 3. ග්‍රීක භාෂාවෙනි
4. නෝර්විජියානු භාෂාවෙනි 5. ප්‍රංශ භාෂාවෙනි (.........)

26. 'නාට්‍ය යනු ජීවිතයේ අනුකරණයකැයි' ප්‍රථමවරට ප්‍රකාශ කරන ලද්දේ
1. ඇරිස්ටෝටල් 2. භරතමුනි 3. ධනංජය 4. ප්ලේටෝ 5. සොක්‍රටීස් (.........)

27. ග්‍රීක කොමඩියක ප්‍රධාන ලක්ෂණයක් නොවන්නේ,
1. විසිහතර දෙනෙකුගෙන් යුත් ගායන වෘන්දනයක් යොදා ගැනීම.
2. නාට්‍ය ප්‍රීතියෙන් කෙළවර වීම.
3. නළුවන් වෙස් මුහුණු යොදා ගැනීම.
4. ගායන වෘන්දනය සටුරයන්ගෙන් සමන්විත වීම.
5. ඇරිස්ටොෆනිස් විසින් කොමඩි රචනා කිරීම. (.........)

28. තියොට්‍රෝන් යනු,
1. එලිසබතීනු යුගයේ ප්‍රේක්ෂකාගාරයක නමකි.
2. පැරණි ග්‍රීක නාට්‍ය සඳහා මුදල් යෙදවූ තැනැත්තාය.
3. ග්‍රීක නාට්‍යයේ ප්‍රේක්ෂකයා නාට්‍ය නැරඹූ ස්ථානයයි.
4. නෝ නාට්‍ය ශාලවකට අයත් අංගයකි.
5. රූකඩ ගෙදර රඟ දැක්වූ වේදිකාවයි. (.........)

29. බුත්, බහු වේදිකා භාවිතා කෙරුනේ,
1. ග්‍රීක නාට්‍ය කලාවෙහි ය. 2. මධ්‍යකාලීන යුරෝපීය කලාවෙහි ය.
3. රෝම නාට්‍ය කලාවෙහිය. 4. සංස්කෘත නාට්‍ය කලාවෙහිය.
5. යුරෝපීය නාට්‍ය කලාවෙහිය. (.........)

30. "Everyman" අයත් වන්නේ පහත නාට්‍ය වර්ග වලින් කුමන වර්ගයට ද?
1. මිස්ටරි 2. මිරකල් 3. මොරැලිටි 4. සැටර් 5. කොමඩි
(.........)

31. රූකඩ ගෙදර නාට්‍යයෙන් ඉදිරිපත් කෙරෙන තේමාවක් නොවන්නේ,
1. ස්ත්‍රී විමුක්තිය 2. විවාහ ජීවිතය පිළිබඳ වෙනත් දෘෂ්ටිකෝණයක් බැලීම.
3. දෛවයේ හස්තය මත ඉරණම තීරණය වේ. 4. පුරුෂාධිපත්‍ය
5. ස්ත්‍රී පුරුෂ සබඳතාවය. (.........)

32. දකුණු පස ඇති පින්තූරයෙන් දැක්වෙන රංග සම්ප්‍රදායට ආවේණික ලක්ෂණ අතර නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.
1. නළුවන් සාත්වික අභින ප්‍රකාශ කරයි.
2. වෙස් මුහුණු භාවිතා කරයි.
3. එක් නළුවෙකු චරිත කිහිපයක් රඟ දක්වයි.
4. නාට්‍ය ධර්මී ලක්ෂණ අන්තර්ගත වේ.
5. සරල රංග උපකරණ භාවිතා කරයි. (.........)



33. පුරාණ ග්‍රීක නාට්‍ය දර්ශනයකදී අත්‍යාවශ්‍ය වූයේ,
1. අංග රචනය 2. සංගීතය 3. වෙස් මුහුණුය.
4. රංගාලෝකනය 5. ශබ්ද විකාශන යන්ත්‍රය (.........)

34. ඩිතිරොම්බොස් ගායනයක් සඳහා යොදාගත් ගායකයන්ගේ සංඛ්‍යාව වන්නේ,
1. 50 කි. 2. 10 කි. 3. 40 කි. 4. 100 කි. 5. 75 කි. (.........)

35. පැරණි ග්‍රීක නාට්‍ය,
1. රඟ දක්වන ලද්දේ සන්ධ්‍යා භාගයේදී ය. 2. නාට්‍ය කෘතිය අංක වලට බෙදා තිබුණි.
3. නාට්‍ය රචකයා හැඳින්වූයේ 'කවි' යන නමිනි. 4. සතර අභිනයම යොදා ගැනුණි.
5. නිෂ්පාදනය භාර වූයේ වෘත්තිකයෙකුට ය. (.........)

36. 'ඔරෙස්ටියා' නාට්‍ය ත්‍රිකය නිර්මාණය කළේ,
1. ඇරිස්ටොෆනිස් ය. 2. ඊස්කිලස් ය. 3. සොෆොක්ලීස් ය. 4. යුරිපිඩීස් ය. 5. අරිස්ටෝටල් ය.
(.........)

37. නාට්‍යකින් ඉටුවිය යුතු අරමුණ වනුයේ,
1. ප්‍රේක්ෂකයාට උසස් රස වින්දනයක් ලබා දීම.
2. විදග්ධ ප්‍රේක්ෂක පිරිසට ගෝචර වීම.
3. ප්‍රේක්ෂකයා ආනන්දයෙන් ප්‍රඥාව වෙත ගෙන යාම
4. තත්කාලීන දේශපාලන හා සමාජ තත්වය නිරූපණය කිරීම.
5. වේදිකාව මත නිතරම සුන්දර දර්ශන මැවීම. (.........)

38. සාර්ථක නළුවෙකු වීමට අවශ්‍ය ලක්ෂණ හා ගුණාංග වනුයේ,
1. මනා රූ සපුවක් තිබීම 2. ප්‍රතිභාව හා කැපවීම 3. ශාරීරික යෝග්‍යතාව
4. පරිකල්පනයෙන් තොරවීම 5. කටහඬෙහි තීව්‍රතාවය (.........)

39. පහත දැක්වෙන නාට්‍ය ඇසුරෙන් ග්‍රීක ප්‍රහසන නාට්‍යක් වන්නේ,
1. ඉග්නෙව්ටායි 2. ප්‍රොමිතියස් බන්ධනය 3. කුක්ලොප්ස් 4. අල්කීස්ටීස් 5. වලාකුළුය.
(.........)

40. වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.
1. සෑම නාට්‍යක්ම තාත්විකය
2. සෑම නාට්‍යක්ම නාට්‍ය ධර්මීය.
3. ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී එකට සංයෝග කළ නොහැක.
4. බොහෝ නාට්‍ය ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී දෙකේ සංකලනයෙන් ඉදිරිපත් කරයි.
5. සියළුම ප්‍රකාශ අසත්‍යයි. (.........)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - දෙවන වාර පරීක්ෂණය 2020**
**නාට්‍ය හා රංගකලාව**
12 ශ්‍රේණිය - **II** පත්‍රය

- **A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

## A - කොටස

01. i. විචාරකයෙකු නාට්‍යයක් විචාරයට ලක්කිරිමේදී සැලකිලිමත් විය යුතු අංග 04 ක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
    ii. නාට්‍ය විචාරකයා සතු ගුණාංග මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
    iii. නාට්‍ය විචාරය නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වන්නේ කෙසේ දැයි විමසන්න. (ලකුණු 06 යි)

03. i. කලාව යනු කුමක්ද? (ලකුණු 04 යි)
    ii. කලාවේ විවිධ ප්‍රභේද උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
    iii. 'නාට්‍ය කලාව සාමුහික කලාවකි' විමසන්න. (ලකුණු 06 යි)

03. i. ශෝකාත්මක නාට්‍යයක මූලිකාංග 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. ඇරිස්ටෝටල්ගේ නාට්‍ය ශාස්ත්‍රයේ කතා වස්තුව (Plot) යන්න කෙසේ විග්‍රහ වන්නේ ද? (ලකුණු 05 යි)
    iii. ග්‍රීක ට්‍රැජඩි නාට්‍ය ප්‍රභවය හා විකාශනය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06 යි)

## B - කොටස

04. i. රූකඩ ගෙදර නාට්‍යයේ තේමාවන් 04 ක් දක්වන්න. (ලකුණු 04 යි)
    ii. රූකඩ ගෙදර නාට්‍ය නිර්මාණය වීම සඳහා යුරෝපයේ සිදු වූ වෙනස්කම් බැලපෑවේ කෙසේද? (ලකුණු 05 යි)
    iii. 'නෝරාගේ වීරත්වය ඇත්තේ අරමුණේ හා එය දිනා ගැනීමේ අභිලාසයෙහි ය' මෙය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

05 i. රූකඩ ගෙදර නාට්‍යයේ ගැටුමට තුඩු දෙන ටෝවල්ඩ් හා හෙල්මර්ගේ චරිත ලක්ෂණ 04 ක් පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)
    ii. රූකඩ ගෙදර නාටයේ සංකේත භාවිතය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 05 යි)
    iii. කුටුම්බය රැකීමට ස්ත්‍රිය දරන්නා වූ උත්සහාය රූකඩ ගෙදර හා කුවේණී නාට්‍යන් ඇසුරෙන් සංසන්දනාත්මක විමර්ශනයක යෙදෙන්න. (ලකුණු 06 යි)

06. i. කාව්‍ය ශාස්ත්‍රයේ දක්වා ඇති නාට්‍ය ප්‍රභේද මොනවාද ? ඊට උදාහරණ දෙක බැගින් නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. ත්‍රිවිධ ඒකීයත්ව සංකල්පය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)
    iii. පශ්චාත් දෘෂ්ඨිකථන ක්‍රමය ග්‍රීක නාට්‍ය ඇසුරෙන් විමර්ශනයට ලක් කරන්න. (ලකුණු 06 යි)

# දෙවන වාර පරීක්ෂණය 2020 - නාට්‍ය හා රංගකලාව

## 12 ශ්‍රේණිය - I පත්‍රය

I කොටස - පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1. 4 | 11. 2 | 21. 4 | 31. 4 |
| 2. 5 | 12. 4 | 22. 1 | 32. 1 |
| 3. 3 | 13. 1 | 23. 5 | 33. 1 |
| 4. 4 | 14. 2 | 24. 1 | 34. 3 |
| 5. 1 | 15. 1 | 25. 3 | 35. 2 |
| 6. 2 | 16. 3 | 26. 2 | 36. 5 |
| 7. 4 | 17. 2 | 27. 1 | 37. 4 |
| 8. 3 | 18. 1 | 28. 2 | 38. 2 |
| 9. 2 | 19. 5 | 29. 4 | 39. 1 |
| 10. 5 | 20. 5 | 30. 5 | 40. 2 |

NWP - EXAM

### II කොටස - පිළිතුරු

### A - කොටස

01. i) i. චරිතයක විවිධ පැතිකඩ (ල. 04)

ii. ශිෂ්‍යයා නාට්‍ය දෙකක් නම් කොට එහි ඇති චරිත දෙකක් තුල වූ භූමිකා ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

iii. භූමිකා අතර ගොඩනැගෙන පරස්පරතා හා එකඟවීම් තුළින් නාට්‍යක ක්‍රියා විකාශනය සිදුවන ආකාරය පැහැදිලි කරන්න. (ල. 06)

02. i) දොවොල් මඩුව, සන්නි යකුම, රට යකුම, ගම් මඩුව (ල. 04)

ii) පහතරට එක් ශාන්තිකර්මයක නාට්‍යම අවස්ථාවන් 02 ක් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල. 05)

iii) ශාන්ති කර්ම ඇසුරින් ආතුරයාගේ මනස සුවපත් වන ආකාරය ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

03) i) වේදිකා නාට්‍ය දෙකක් ලියා ඒවායෙහි සංගීත නිර්මාණකරුවන් දෙදෙනෙකු නම් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

ii) (ල.05)

iii) වේදිකා නාට්‍යයක අවස්ථා උද්දීපනය සංගීතය යොදාගෙන ඇති ආකාරය නාට්‍යයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල. 04)

### B - කොටස

04. i. පූජා කර්ම - දොරකඩ අස්න, ආලවක දමන බණ, විලිඳු නාගසේන බණ, සුවිසි විවරණ (ල.04)
අභිචාර විධි - ශාන්ති කර්ම

ii. ආලවක දමනය
මිලින්ද ප්‍රශ්නය ආදිය විස්තර කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

iii. බෞද්ධ පූජා කර්ම වලට සතර අභිනය යොදාගත් ආකාරය පූජා කර්ම දෙකක් ඇසුරින් විමර්ශනය කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

05. i. නාට්‍යයේ පිටපත, නාට්‍යයේ තේමාව, නාට්‍යයේ ශෛලිය, නළු නිළියන්ගේ රංග කාර්යය, අනුෂාංගික අංග භාවිතය, නාට්‍යයේ නිර්මාණාත්ක බව (ල. 04)

ii. නිර්මාණාත්මක රස වින්දනයේ යාවත්කාලීනයකු විය යුතුය.

විවිධ ශෛලියේ නාට්‍ය රස විඳින්නකු විය යුතුය.
විවිධ විචාර සිද්ධාන්ත අධ්‍යයනය කරන අයකු විය යුතුයි.
බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තකු විය යුතුයි.
නානා විධ කෘති හඳුනාගත යුතුය.
විචාරකයා තුළ තුලනාත්මක දෘෂ්ටියක් තිබිය යුතුය. (ල.05)

iii. නාට්‍ය විචාරය නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වී ඇති අයුරු ශිෂ්‍යයා විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල 06)

06. i. කලාව යනු කුමක්දැයි විස්තර කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 04)

ii. සංගීත කලාව, සාහිත්‍ය කලාව, නාට්‍ය කලාව, චිත්‍රපට කලාව, මූර්ති කලාව, ආදි කලාවන් උදාහරණ සහිතව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

iii. නාට්‍ය කලාව කලාවන් රැසකගේ දායකත්වය තුලින් නිර්මාණය වේ.

නාට්‍ය කලාව සඳහා ශිල්පීන් රැසකගේ දායකත්වය ලැබේ.

නාට්‍ය කලාව සඳහා ප්‍රේක්ෂකයින් රැසක් අවශ්‍ය වේ.

මේ නිසා නාට්‍ය කලාව සාමූහික කලාවක් වන බව විමසා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

# නාට්‍ය හා රංගකලාව 2020 - 12 ශ්‍රේණිය - II පත්‍රය

## I කොටස - පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1. 5 | 11. 4 | 21. 4 | 31. 3 |
| 2. 4 | 12. 3 | 22. 2 | 32. 1 |
| 3. 4 | 13. 1 | 23. 3 | 33. 3 |
| 4. 5 | 14. 2 | 24. 2 | 34. 1 |
| 5. 2 | 15. 4 | 25. 4 | 35. 5 |
| 6. 2 | 16. 5 | 26. 1 | 36. 2 |
| 7. 1 | 17. 5 | 27. 4 | 37. 3 |
| 8. 3 | 18. 4 | 28. 3 | 38. 2 |
| 9. 2 | 19. 2 | 29. 2 | 39. 5 |
| 10. 4 | 20. 2 | 30. 3 | 40. 4 |

01. i) i. කතා වස්තුව, චරිත, වාග් විලාසය, චින්තනය, ප්‍රේක්ෂාව, සංගීතය (ල. 04)

ii. කතා වස්තුව යනු සිද්ධි ගැලපීමේ පිළිවෙලයි. එය සරල හා සංකීර්ණ වශයෙන් දෙයාකාරය.
සරල කතා වස්තුව කේවල හා අඛණ්ඩ ක්‍රියාවලියකින් යුක්ත වන අතර සංකීර්ණ වස්තුව ප්‍රත්‍යාවර්තනය හා ප්‍රත්‍යාභිඥනය යන අවස්ථා දෙකකින් යුක්තය.
ඉහත කරුණු අන්තර්ගතව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.05)

iii. දියෝනිසස් වන්දනාව, තෙස්පීස්ගෙන් රංගනය ආරම්භ වීම, රජය මැදිහත්වීමෙන් නාට්‍ය තරඟ පැවැත්වීම, ඊස්කිලස්, සොෆොක්ලීස්, යුරිපිඩීස් නාට්‍යකරුවන්ගේ දායකත්වය ආදී කරුණු ඇතුළුව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.04)

02. i) කුවේණිය කපු කැටීමේ නිරත වන අවස්ථාව — විජය කුවේනි මුණ ගැසීම.
කුවේණි හා විජය අතර මතුවන ගැටුම — කුවේණිය දරුවන් සමඟ මාලිගයෙන් නික්මීම.
නෑදැයින්ගෙන් අවමන් ලැබීම. — දරුවන් වනගතවීම. (ල.4)

ii) කුවේණි නාට්‍ය සැබෑ ගැහැණියට සාධාරණය ඉටු කරයි. යන කියමනට උදාහරණ සහිතව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.05)

iii) ශිෂ්‍යයා විචාරයකට ලක්කර ඇති කරුණු විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

03) i) විජයාගමනය හා සම්බන්ධ ප්‍රවෘත්තිය යොදා ගෙන ඇති අතර, යටි පෙළින් කුවේණිය යනු සදාතනික දුක්පීඩා, නින්දා, අපහාස ආදී අසාධාරණයට ලක්වන කාන්තාව පිළිබඳ ස්මතු වේ. (ල. 04)

ii) චරිත නිර්මාණය පිළිබඳව නිදසුන් සහිතව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

WWW.WP-EXAM

iii) කුවේණි නාට්‍යය මූලාශ්‍රයෙන් වෙනස් වන ආකාරය නාට්‍ය පෙළ ඇසුරින් සංසන්දනාත්මක විමසා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

## B කොටස

04. i. ස්ත්‍රී විමුක්තිය, පොදු මානව විමුක්තිය, විවාහ ජීවිතය පිළිබඳ වෙනත් දෘෂ්ටිකෝණයෙන් බැලීමට පදනමක් (ල. 04)

ii. වැඩවසම් සමාජ ක්‍රමය වෙනස් වී මධ්‍යම පන්තියක් බිහිවීම.
මාක්ස් එංගල්ස් වැනි චින්තකයින්ගේ සමාජගත වීම.
කාර්මික විප්ලවය
ආගමික වෙනස්කම් ඇතිවීම යනාදිය නාට්‍යයට බලපා ඇති ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.05)

iii. නෝරාගේ අරමුණු දිනා ගැනීමට ඇයගේ ක්‍රියා කලාපය ඇසුරින් පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

05. i. පුරුෂාධිපත්‍යය, මධ්‍යම පාන්තික ආර්ථික වටිනාකම්, සාම්ප්‍රදායික චින්තනය වැනි චරිත ලක්ෂණ (ල. 04)

ii. නත්තල් ගස, මැකරෝනී, සෙල්ලම් ඇඳුම, තරන්තලා නැටුම වැනි සංකේත භාවිතය ගැන ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

iii. කුවේණි හා නෝරා ස්වාමියා පිළිබඳ දරණ ආකල්ප
කුවේණි හා නෝරා දරුවන් අතර බැදීම
කුටුම්බය රැකීමට දෙනොම ගනු ලබන ක්‍රියාමාර්ග විස්තර කිරීම (ල. 06)

06. i. ට්‍රැජඩි :- ඊඩිපස්, ඇන්ටගනී, ප්‍රොමිනියස් බන්ධනය
කොමඩි :- වළාකුළු, මැඩියෝ, සාමය, කුරුල්ලෝ
සැටර් :- ඉග්නොව් ටා ඉ, සයික්ලොස්ට් (ල. 04)

ii. කලා ඒකීයත්වය, ක්‍රියා ඒකීයත්වය, දේශී ඒකීයත්වය යන ත්‍රිවිධ ඒකීයත්තව සංකල්පය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

iii. අතීතය අනාවරණය කරමින් වර්තමාන සිදුවීම් ඔස්සේ කතාව විකාශනය වන ආකාරය ග්‍රීක නාට්‍යක් ඇසුරින් විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

NWP - EXAM


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON
DELIVERY
HOME
DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440